

# ටෙලිනාට්‍ය ඉඩෝරයට රුක්මල් ගෙන් පොද වැස්සක්

මෑත භාගයේ විකාශය වූ ටෙලි නාට්‍ය දෙස බලන සෑම කෙනෙකුගේම සිතේ පහල වන අදහස නම් අපේ අපේ ටෙලි නාට්‍ය කලාවට මොකද වුණේ යන්නයි. ඉතා ජනප්‍රිය කලාවක් වී තිබුණ ටෙලි නාට්‍යය ප්‍රේක්ෂකයා වෙතින් බොහෝ සීඝ්‍රයෙන් ඈත් වෙමින් පවතියි. මෙයට හේතු වූ මූලික කාරණාව කුමක්දැයි සළකා බැලීමේ දී ටෙලි නාට්‍ය ක්ෂෙත්‍රයේ දැවැන්තයෝ විවිධ මත පළකරති. ඒ කෙසේ වෙතත් ප්‍රේක්ෂකයා ගැන සතයකට මායිම් නොකර විවිධ අනුග්‍රහයන් යටතේ (රාජ්‍ය අනුග්‍රහයද සමග) හරසුන් ටෙලිනාට්‍ය රැල්ලකට අප හසුව ඇති බව පෙනෙයි.



ටෙලිනාට්‍ය අර්බුදය ගැන කතා කරනවා නම් විශාල ලෙස ඒ ගැන කතා කළ හැකිය. එහෙත් මේ එයට අවස්ථාව නොවේ.

ජූලි මස 20 වන දින මෙල්බන් නගරයේ අපට නරඹන්නට ලැබුණ රුක්මාල් නිරෝෂන් නම් වන අධ්‍යක්ෂවරයා හා සංස්කරණ ශිල්පියාගේ සුළඟ මත මොහොතක් ටෙලි නාට්‍යය ඉහත රැල්ලෙන් මිදුනු අපූරු ටෙලි නාට්‍යයක් බව එදින එය නැරඹූ විශාල ප්‍රේක්ෂක සමූහය සාක්ෂි දරනු ඇත. කොටස් 35කින් යුත් (පැය 10කට නොඅඩු කාලයක) දීර්ඝ ටෙලි නාට්‍යය පැය තුනහමාරක් වැනි කෙටි කාලයකට සංස්කරණය කරමින් මූලික කතා තේමාවට කිසිම හානියක් නොවන අයුරින් ටෙලි චිත්‍රපටයක් ලෙස නිර්මාණය කිරීමට අධ්‍යක්ෂවරයාට වඩා සංස්කාරක ශිලපියා ඉදිරියෙන් සිටි බව නොරහසිකි. මා එසේ කියන්නේ සියලු කොටස් නැරඹූ ප්‍රේක්ෂක අතලොස්සට මා ද අයත් වන බැවිනි.

යම් ටෙලි නාට්‍යයක් නිර්මාණයේදී අධ්‍යක්ෂවරයකුගේ සිතට නැගෙන ප්‍රධාන කාරණය වනුයේ කුඩා දරුවාගේ සිට වැඩිහිටියකු දක්වා විවිධ වයස් මට්ටම් වල හා විවිධ බුද්ධි මට්ටම් වල ප්‍රේක්ෂක පිරිසක් ටෙලි නාට්‍ය හා බැඳී සිටින බවයි. වර්ගය හා ජාතිය අනුවද ප්‍රදේශයෙන් ප්‍රදේශයට ගෙවන ජීවන මට්ටම් අනුවද බොහෝ දෙනා සිතන පතන අයුරු වෙනස්වෙයි. එබැවින් ටෙලි නාට්‍යයට කතාවක් තෝරාගන්නා මොහොතේදීම නිර්මාණකරුවාගේ සිතට එන කරුණක් නම් විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවකට බලපෑමක් කළ හැකි සරළ කතාවස්තුවක් කෙසේ තෝරාගතයුතුද යන්නයි. නාට්‍ය කරුවකුට හා චිත්‍රපටකරුවකුට ඇති ස්වාධීන අයිතිය රූපවාහිනී ටෙලි නාට්‍ය විසින් මෙසේ සීමා කරනු ලබයි. එහෙත් රුක්මාල් ආදරය නමැති අප කාටත් පොදු තේමාව ඔස්සේ විශාල ගැඹුරු මාතෘකාවක් කතාකරයි. බොළඳ ආදරය සැබෑ ආදරය පවුල් ජීවිතය දෙමාපිය බලපෑම බාහිර බලවේග ජීවිතය හා ඇති ගතානුගතික බැඳීම් යන මේ සෑම දෙයක්ම නිර්මාණය තුළ ගැබ් වී තිබීම රුක්මාල් ගේ දක්ෂතාව යයි අපට පෙනෙයි.

කෙළිලොල් තරුණයකු හා තරුණියක අතර ඇතිවන සැබෑ ප්‍රේමයක ඛේදවාචකයක් සුළඟ මත මොහොතක් ටෙලිනාට්‍යයට ගැබ්ව ඇත. දෙමාපියන්ගේ බලවත් විරෝධතා හේතුවෙන් තරුණියට මහාචාර්යවරයකු සමග විවාහ වන්නට සිදුවෙයි. ඔහු අතින් පීඩා විඳින ඇය රෝගයකට ගොදුරුවෙයි. ඇගේ අවසන් මොහොතේ ඇය හමුවන්නේ තවමත් ඇය පිළිබඳ ප්‍රේමයෙන් කම්පාව සිටින ඇගේ පෙම්වතායි. මේ අනුවේදනීය කතාව ඉදිරියට ගලා යන්නේ ප්‍රේක්ෂකයන්ගේ සිත් කම්පාවට පත් කරමින් ය. මේ බැරෑරුම් කතාව අපහසුවකින් තොරව නරඹන්නට හැකිවන ආකාරයෙන් හාස්‍යයද එක් කරන්නට කතාරචකයා සමත්ව තිබෙයි.

මෙහි ඇති අනික් සාධණීය ලක්ෂණය නම් දෙබස් රචනයේදී ප්‍රියංකර රත්නායක පා ඇති දක්ෂතාවයි. ඉතා කෙටි දෙබස් බොහෝ තැන්වල දී අපට ඇසුණි. ප්‍රශ්නයකට සමහර විට පිළිතුරු ලැබුණේද ප්‍රශ්නයකින්මය. මේ දෙබස් රටාව මේ ටෙලි නාට්‍යයේ ප්‍රබල බව වැඩි කරන්නට ඉවහල් වූයේ යයි මම සිතමි.

අනවශ්‍ය කැමරා හරඹ වලින් බැහැරව කතාවට ගැලපෙන කැමරා කෝණ භාවිත සහ කැමරාවක් තිබෙන බව හෝ අපට නොදැනෙන අයුරින් රූප ගත කර තිබීම ප්‍රශංසනීයයි.

මේ සියළු දෙයට වඩා විශේෂ වන්නේ සංස්කරණයයි. සම්මාණනීය සංස්කරණ ශිල්පියකු වශයෙන් රුක්මාල් නිරෝෂන් සතු ප්‍රතිභාව මේ ටෙලි නාට්‍යය තුළින්ද ඔහු මොනවද පෙන්වා දී ඇත . අධ්‍යක්ෂවරයාම සංස්කරණ ශිල්පියා වීමේ භාග්‍යයද රුක්මාල් මෙහිදී උපකාර වන්නට ඇතැයි මට සිතෙයි.

සාරංග දිසානායක මෙතෙක් රඟපෑ පෙම්වතාගේ හොඳම චරිත නිරූපනය ඔහු වෙතින් උකහාගන්නට රුක්මල් සමත්ව ඇත. එසේම තිසරි යුවනිකා වම් වන යව්වන රංගන ශිල්පණියගේ හැකියාවන් මනා ලෙස විදහා පාන්නට ඇයට අවස්ථාව ලබාදීමේ ගෞරවයද අධ්‍යක්ෂවරාට හිමිවෙයි. මහේන්ද්‍ර පෙරේරා කෞෂල්‍යා ප්‍රනාන්දු ඩබ්ලිව් ජයසිරි චාන්දනී සෙනෙවිරත්න බිමල් ජයකොඩි වැනි ප්‍රවීණයන් හා සම මට්ටමේ රංගනයක යෙදෙන්නට මේ තරුණ රංගන ශිල්පින් හා ශිල්පිනියන්ට හැකිවන්නට ඔවුන් ගේ ප්‍රතිභාවත් ඔවුන් නිසි ලෙස හසුරුවාගන්නට අධ්‍යක්ෂවරයාට ඇති මනා හැකියාවත් එක්ව බලපාන්නට ඇතැයි මම සිතමි.

සුළඟ මත මොහොතක් මෙල්බන්හි වසන්ත බණ්ඩාර විසින් නිෂ්පාදනය කරන ලද අතර සංගීතවත් කරනු ලැබ ඇත්තේ කසුන් කල්හාර විසිනි. තිර රචනය හා කතාව ප්‍රියංකර රත්නායක ගේ ය.




අප ඇද බැඳ ගත් 70- 80 දශකයේ තිබූ ටෙලිනාට්‍ය කලාව වෙත අප ගෙන යාම රුක්මල් නිරෝෂන් ගේ අභිප්‍රාය බව ඔහු ප්‍රකාශ කළේ ය. ඔහුගේ ඒ අරමුණ සියයට සියයක් සැබෑ ඇති බව සුළඟ මත මොහොතක් නරඹන විට මට සිතෙයි. 70 - 80 දශකයේ අපේ හදවත් තුළ නොමැකෙන ලෙස සටහන් වූ ටෙලිනාට්‍ය හා චරිත අතරට රුක්මල් ගේ සුළඟ මත මොහොතක් ටෙලි නාට්‍යයත් එහි චරිතත් එක්වන බව සඳහන් කිරීම මේ තරුණ අධ්‍යක්ෂවරයාගේ දක්ෂතාව පිළිබඳ සහතිකයක් වෙයි.


## Invest in Sri Lanka!

Now is the ideal time to invest in building & property in Sri Lanka and take advantage of the post-war boom.

We are a Design & Construction company that operates in Colombo and Melbourne with a team of highly qualified, architects, engineers. Quantity-surveyors and builders offering a wide variety of services

We can deliver wide range of projects from a simple retirement bungalow to boutique hotels.

We are in a position to undertake the entire process from initial sketch design to the actual building construction on site.

**Asanka Jayawardena**
Architect
B.Arch(Melb) M.PropCon(Melb) RAIA
**T: (03) 9323 7393 M: 0402 443 554**


## දරුවන් උගත යුත්තේ තම වයසට ගැලපෙන දේ පමණකි

### රසික සුරියආරච්චිට පිළිතුරක්

මෙල්බර්න් නුවර පලවන අතලොස්සක් සිංහල පුවත්පත් අතරින් "සන්නස" පුවත්පත අප බොහෝ දෙනෙකු කියවීමට අපේක්ෂාවෙන් සිටින සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් තොරතුරු ඇතුලත් පුවත්පතක් බව අප විසින් පිලිගැනෙයි. ඒ වෙනුවෙන් එම පුවත්පත සම්පාදනය කරන සංස්කාරකවරුන් හට අප විසින් ස්තූති කල යුතුය.

නමුත් පසුගිය කලාපයේ පලවු රසික සූරියආරච්චි විසින් ලියන ලද "ගණිකාව සහ ඔසප, ඔසප, ඔසප" මැයෙන් වූ ලිපිය බොහෝ දෙනෙකුගේ පිලිකුලට භාජනය වු බව දන්වා සිටිම මාගේ යුතුකමක් කොට සලකා ඊට පිලිතුරක් මේ මගින් ඉදිරිපත් කරමි. එය මුළු පුවත්පතේම අන්තර්ගත අනෙකුත් ලිපිවල ද තත්ත්වය බාල කරන්නක් විය.

එම ලිපිය පල කරන පුද්ගලයා ඒ මගින් බලාපොරොත්තු වන සමාජයට දීමට සිතා සිටින පණිවුඩය කුමක්දැයි පැහැදිලිය.

සිංහල භාෂාවේ ඇති සියලු වදන් පාසලේදී ඉගෙන නොගන්නා බව සත්‍යයකි. ප්‍රාථමික ශ්‍රේණියේ දරුවකු හට ගෝලියකරණය වැනි සංකල්ප වල අදල බව කුමක්ද ? ඒ ආකාරයට එම දරුවා ඔහුගේ/ඇයගේ වයසත් සමග ඒ නිසි අධ්‍යාපනය ලබනු ඇත.

ක්‍රමයෙන් ළමා වියේදී තේරුම් ගත නොහැකි සංකීර්ණ සංකල්ප තරුණ වියේදී තේරුම් ගනු ඇත. ඒ සඳහා ඇති කලබලය කුමක්ද?

අප හට පැන නැගුන ඊලග ගැටළුව වුයේ මේ ලිපිය ලියන පුද්ගලයා තෝරා ගෙන ඇති 'ගණිකාව සහ ඔසප" යන වදන් ඔහු විසින් තිත්ත කුණුහරුප යන ගණයට වර්ග කලේ ඇයිද යන්නයි. ඔහු විසින් නිවැරදි අධ්‍යාපනයක් ලැබුයේ නම් එම වදන් එම ගණයට නොදමනු ඇත.

ලිපියෙහි පිලිකුල්ම වැකිය වුයේ අවසන් වැකියයි. ඒ 'අර්ශස් ! අර්ශස් ! අර්ශස් !'. ඒ මගින් ලිපිය ලියන පුද්ගලයාගේ මානසික මට්ටම මොනවට පැහැදිලි වී ඇත. එය මුළු කාන්තා පරපුරටම (ඔහුගේ මව, බිරිය සහ සොහොයුරියන් ඇතුලත්ව) ඔහු විසින් කරන ලද නිගාවකි. එමෙන්ම එය කුඩා දරුවකුගේ මනස පවා වියවුල් කරන්නකි.

මෙවන් ගණයේ ලිපි "සන්නස" පුවත්පතට නොගැලපෙන බව අවසන් වශයෙන් ප්‍රකාශ කරමි.

රෝස දෝන